# අගලවත්ත ප්‍රාදේශීය සභාව

## කළුතර දිස්ත්‍රික්කය

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 25 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 28 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 සැප්තැම්බර් 15 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාලව කැබ් රථයේ මාසික වාරිකයක වටිනාකම වූ රු.88,284 ක් මෝටර් රථ ගිණුම හර කර ප්‍රාග්ධනයට ආදායමින් දායකවීමේ ගිණුම බැර කර නොතිබීම නිසා සමාලෝචිත වර්ෂයේ වත්කම් ගිණුම හා ප්‍රාග්ධනයට ආදායමින් දායකවීමේ ගිණුම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) පළාත් පාලන ආයතනවල ගිණුම් තැබීමේ පරිපාටියට අනුව ස්ථාවර වත්කම්වල එකතුව ප්‍රාග්ධනයට ආදායමින් දායක වීමේ ගිණුමේ හා ප්‍රාග්ධනයට ආධාර මගින් දායකවීමේ ගිණුම යන ගිණුම් දෙකේ එකතුවට සමාන විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ එම ගිණුම් දෙක අතර රු.39,994,479 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු රු.2,819,877 ක මුදල මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයට අදාල රු.1,249,111 ක් වූ වරිපනම් බදු ආදායමක් බදු කුලී ආදායම් වශයෙන් ගිණුම් ගත වීම හේතුවෙන් වර්ෂයේ වරිපනම් ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන්ද බදු කුලී ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන්ද දක්වා තිබුණි.

(ඉ) ඉකුත් වර්ෂයට අදාල මුද්දර ගාස්තු ඌන වෙන්කිරීම් රු.2,633,525 ක් හිඟ හිටි මුද්දර ගාස්තු හර කර සමුච්චිත අරමුදල බැර කළ යුතු වුවත්, වර්ෂයේ ආදායමට බැර කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. තවද, සමාලෝචිත වර්ෂය සඳහා මුද්දර ගාස්තු ආදායම වශයෙන් රු.7,000,000 ක් බිල් කර තිබූ නමුත් වර්ෂය තුළ ඉන් ලැබී තිබුණේ රු.3,494,670 ක් පමණක් බැවින් 2016 දෙසැම්බර් 31 දිනට හිඟ හිටි මුද්දර ගාස්තු ගිණුමේ ශේෂය රු.3,505,330 ක් විය යුතු වුවත් රු.2,014,194 ක් වශයෙන් දැක්වීම හේතුවෙන් හිඟ හිටි මුද්දර ගාස්තු ගිණුමේ ශේෂය රු.1,491,136 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන්ට පාවහන් ලබාදීමේ ව්‍යාපෘතියට අදාලව සමාලෝචිත වර්ෂයේ ලැබී තිබූ රු.1,710,000 ක මුදල ආදායම් ආධාර යටතේ ගිණුම් ගත කර ඇතත් ඊට අදාල වියදම ප්‍රවර්තන වර්ෂයේ වියදමක් ලෙස ගිණුම් ගත කර නොතිබීම හේතුවෙන් වර්ෂයේ වියදම හා ණයහිමියෝ රු.1,710,000 කින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(උ) 2016 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේදී රු.20,625 ක් වටිනා භාණ්ඩ පවතින බව තහවුරු කරගෙන ඇතත් ඒවා මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

(ඌ) 2014 විගණන වාර්තාවේ (ඇ) අනුව ලැබිය යුතු වැටුප් ප්‍රතිපූර්ණ රු.1,364,076 ක් ආදායම් ආධාර ගිණුමට පමණක් ගිණුම් ගත කිරීම නිවැරදි කිරීම සඳහා 2015 වර්ෂයේදී, ලැබිය යුතු ආදායම් ගිණුම රු.1,364,076 කින් හර කර සමුච්චිත අරමුදල එම වටිනාකමින් බැර කිරීම හේතුවෙන් සමුච්චිත අරමුදල් ගිණුමේ ශේෂය රු.1,364,076 කින් වැඩියෙන් දක්වා තිබුණි.

### 1.3.2 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.14,507,559 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදයම රු.11,038,346 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදයම රු.2,516,651 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.8,521,695 ක වර්ධනයක් දක්නට ලැබුණි.

මූල්‍ය ප්‍රතිඵලයේ රු.8,521,695 ක වර්ධනය කෙරෙහි ආදායම් රු.6,775,724 කින් වැඩිවීම හා වියදම් රු.1,745,971 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිලිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. 000' | රු.000' | රු.000' |
| (i) වරිපනම් හා බදු | 2,819 | 2,530 | 640 |
| (ii) බදු කුලී | 2,599 | 2,467 | 132 |
| (iii) බලපත්‍ර ගාස්තු | 154 | 154 | -- |

#### 2.2.2 වරිපනම් බදු

(අ) 2016 ජනවාරි 01 දිනට රු.768,134 ක් වූ හිඟ හිටි වරිපනම් බදු ශේෂයෙන්, 2016 දෙසැම්බර් 31 දින වන විට රු.424,204 ක් හෙවත් සියයට 55 ක් අයකරගෙන තිබුණි. පසුගිය වර්ෂයට අදාල හිඟ මුදලින් තවදුරටත් හිඟය රු.343,930 ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා වරිපනම් බිල් කළ ආදායම රු.1,658,508 ක් වූ අතර සමාලෝචිත වර්ෂය තුළ රු.1,375,829 ක් හෙවත් සියයට 83 ක් අයකරගෙන තිබුණි. ප්‍රවර්තන වර්ෂයේ බිල් කළ මුදලින් සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ ශේෂය රු.282,679 ක් විය.

2.2.3 **<u>නාමපුවරු/ප්‍රචාරක දැන්වීම් සඳහා ගාස්තු</u>**

2015 දෙසැම්බර් 04 දිනැති අංක 1944 දරන ගැසට් පත්‍රයේ වූ අගලවත්ත ප්‍රාදේශීය සභාවේ 2016 වර්ෂයට අදාලව ප්‍රචාරක දැන්වීම් පිළිබඳ නිවේදනයට අනුව ප්‍රාදේශීය සභා සීමාව තුළ ප්‍රචාරක දැන්වීම් ඉදිකිරීම හා ප්‍රදර්ශණය කිරීම වෙනුවෙන් සමීක්ෂණයක් සිදු කර ගාස්තු අය කළ යුතු වුවත් එසේ කර නොතිබුණි. ඒ අනුව ප්‍රචාරක දැන්වීම්/නාම පුවරු 31 ක් සඳහා අහිමි වූ ආදායම රු.149,439 ක් විය.

2.2.4 **<u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2016 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 2,553,995 |
| (ii) | මුද්දර ගාස්තු | 2,014,194 |

3. **<u>මෙහෙයුම් සමාලෝචනය</u>**

3.1 **<u>මෙහෙයුම්/කළමනාකරණ අකාර්යක්ෂමතා</u>**

(අ) **<u>තොග පාලනය</u>**

2016 දෙසැම්බර් 31 දිනට සිදු කරන ලද භාණ්ඩ සමීක්ෂණයට අනුව ගැල්වනයිස් බට 50 ක ඌනතාවයක් පිළිබඳ කරුණු ඉදිරිපත් කර තිබුණද, එම ඌනතාවය පියවාගැනීමට 2017 ජූනි 13 වන විටත් ක්‍රියා කර නොතිබුණි.

(ආ) **<u>වාහන පාලනය</u>**

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයෙන් 2010 අගෝස්තු 10 දින ලැබුණු JCB3DX යන්ත්‍රය මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර නොතිබීම හේතුවෙන් වාහනය සඳහා ආදායම් බලපත්‍රය හා රක්ෂණ සහතිකය ලබාගත නොහැකි වී තිබුණි.

(ඇ) 2010 වර්ෂයේ සිට පැවත ගෙන ආ රු.43,795 ක් වූ ජාතිය ගොඩනැගීමේ බදු ශේෂය නිරවුල් කිරීම වෙනුවට සමාලෝචිත වර්ෂයේදී එය සමුච්චිත අරමුදලට බැර කර තිබුණි.

4. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) අයවැය පාලනය